අපේ වටිනා රබර් පිටරට යවා, ඒ මගින් නිෂ්පාදිත භාණ්ඩ විශාල මුදලකට ගැනීමට සිදුවී ඇති අවදියක අපේ වටිනා රබර් ප්‍රයෝජනයට ගෙන තත්ව- යෙන් උසස් භාණ්ඩ අපම නිෂ්පාදනය කර ගැනීම නුවණට හුරුය.

# රබර් කර්මාන්තයෙහි අපට හිමි තැන

ඒ. ඇම්. ඒ. අමරපති

ශ්‍රී ලංකාවට වසරකට ලැබෙන මුළු විදේශ විනිමය ප්‍රමාණයෙන් දළ වශයෙන් 15-20% පමණ ලැබෙන්නේ ස්වාභාවික රබර් අපනයනය කිරීමෙනි. ලංකාවේ රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 560,000 ක් පමණ වේ. මෙයින් 35% ක් පමණ විශාල ඉඩම් වන අතර ඉතිරිය ඊට වඩා අඩුය. සාමාන්‍යයෙන් එක් අක්කරයකින් වසරකට අවම වශයෙන් රබර් රාත්තල් 750 ක් පමණ ලබා ගත හැක.

මෑතක් වන තුරුම ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදිත රටවල් අතුරින් හතරවන තැන ශ්‍රී ලංකාව සතුව තිබූ නමුත් දැන් ඉන්දියාව හතරවන ස්ථානයට පැමිණ ඇති අතර අපට පස්වන ස්ථානය අයත් වී තිබේ.

1977 වසරේ ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනය වී ඇති අන්දම පහත දැක්වේ.

| | මෙට්‍රික් ටොන් |
|---|---:|
| මැලේසියාව | 1,613,193 |
| ඉන්දුනීසියාව | 835,000 |
| තායිලන්තය | 422,861 |
| ඉන්දියාව | 151,609 |
| ශ්‍රී ලංකාව | 146,243 |
| වියට්නාමය | 35,000 |
| චීනය | 30,000 |
| බ්‍රසීලය | 180,000 |
| කාම්බෝජය | 15,000 |
| වෙනත් අප්‍රිකානු රටවල් | 209,763 |
| ලතින් ඇමරිකාව | 18,000 |
| මුළු නිෂ්පාදනය | 3,590,000 |

ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන රබර් වලින් වැඩි ප්‍රමාණයක් අපනයනය කරන අතර දේශීය පාරිභෝජනය සඳහා ගනු ලබන්නේ ඉතා සුළු ප්‍රමාණයකි.

1978 වර්ෂයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර ඇති මුළු රබර් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 155,662 කි.

| | |
|---|---:|
| ආර්. ඇස්. ඇස්. රබර් ෂීට | 91,975 |
| සෝල්ක්රේප් | 5,107 |
| ස්ක්‍රැප් ක්රේප් | 14,719 |
| ලේටෙක්ස් ක්රේප් | 36,555 |
| සාන්ද්‍ර රබර් කිරි | 1,090 |
| කුට්ටි රබර් | 6,216 |
| | 155,662 |

මෙම වසර තුල අප විසින් රබර් භාණ්ඩ නිෂ්පාදනය සඳහා ටොන් 9072 පරිභෝජනය කර ඇත. මෙයින් පැහැදිලි වන එක් කරුණක් නම් දේශීය නිෂ්පාදන රබර් වලින් 94.2% පමණ අපනයනය කර ඇති අතර අප විසින් රබර් භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන්නේ ඉතා සුළු ප්‍රමාණයක් බවය.

එහෙයින් රබර් ගසක්වත් නොමැති යුරෝපීය රටවල් ස්වාභාවික රබර් නිෂ්පාදිත රටවලින් උසස් තත්වයේ රබර්

භාණ්ඩ නිෂ්පාදනය කර, එම භාණ්ඩ නැවතත් අපනයනය කර රුපියල් කෝටි ගණන් උපයා ගනී.

1977 වසරේ රටවල් කිහිපයක් විසින් රබර් භාණ්ඩ නිෂ්පාදනය සඳහා උපයෝගී කර ඇති රබර් ප්‍රමාණ පහත දැක්වේ.

| | මෙට්‍රික් ටොන් |
|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 803,489 |
| එංගලන්තය | 172,400 |
| ප්‍රංශය | 162,623 |
| ජර්මනිය | 194,420 |
| ඉතාලිය | 128,000 |
| නෙදර්ලන්තය | ?1,190 |
| චීනය | 280,000 |
| ජපානය | 320,000 |
| වෙනත් යුරෝපීය රටවල් | 215,000 |

ලෝකයේ නිෂ්පාදිත මුළු ස්වාභාවික රබර් ප්‍රමාණයෙන් 60% ක් පමණ භාවිතා කරනු ලබන්නේ ටයර් නිෂ්පාදනය සඳහාය. මෙයට අමතරව සැළකිය යුතු රබර් ප්‍රමාණයක් සපත්තු, මෝටර් රථ අමතර කොටස්, රබර් නල, ක්‍රීඩා භාණ්ඩ, ටියුබ් ආදිය නිෂ්පාදනය සඳහා යොදා ගනු ලැබේ. එහෙත් ලෝකයේ හොඳම ක්‍රේප් රබර් නිෂ්පාදනය පිළිබඳව ප්‍රසිද්ධියක් ලබා ඇති අප, ඉහත දැක්වූ එකම රටක් මගින් වත්, නිෂ්පාදනය කරනු ලබන රබර් භාණ්ඩ වලින් $\frac{1}{10}$ ක් වත් නිපදවීමට බැරි තත්ත්වයක පසුවේ. මේ නිසා අපට අවශ්‍ය රබර් භාණ්ඩ රැසක් ආනයනය කිරීමට සිදුවී ඇත. මීට හේතුව දේශීය නිෂ්පාදකයින්ට උසස් තත්වයේ භාණ්ඩ නිෂ්පාදනය සඳහා පුළුල් අවබෝධයක් හෝ පළ පුරුද්දක් නොමැතිකම ය. ලංකාවේ විශාල පරිමාණයේ රබර් කර්මාන්ත ශාලා කීපයක් හැර අනෙක් සියළුම සුළු කර්මාන්ත කරුවන් විසින් නිපදවනු ලබන රබර් භාණ්ඩ වෙළඳපොලෙහි අලෙවි කිරීමට කිසිසේත් සුදුසු තත්ත්වයක නොපවතී. උදාහරණයක් වශයෙන් ලංකාවේ නිෂ්පාදිත එකම සූප්පුඩක්ට්ත් (ළදරුවන් කිරිබීමට උපයෝගීකර ගන්නා) දේශීය ප්‍රමිතියන්ට අනුකූල නැත. මේ හේතුව නිසා එම සූප්පු දින කීපයකට වඩා පාවිච්චි කළ නොහැක. එසේත් නැත්නම් එම සූප්පු වලින් කිරි පානය කරන ළදරුවන්ට අජීර්ණ රෝග නිතර වැළඳේ. දේශීය නිෂ්පාදිත රබර් භාණ්ඩවලින් තවත් එක් භයානක දෙයක් නම් මෝටර්රථ වලට සවිකරන බ්රේක් වොෂර්ය. දේශීය නිෂ්පාදනයන්ගෙන් සියයට 95% ක් පමණ සඳහාම උපයෝගී කරගන්නේ ස්වාභාවික රබර්ය. ස්වාභාවික රබර් වලින් නිපදවනු ලබන ඕනෑම භාණ්ඩයක්, භූමිතෙල් පෙට්රල් ලිහිසිතෙල් හෝ ඩීසල් වැනි තෙල් සමග ගැටුන විට රබර් භාණ්ඩය එම තෙල් උරාගෙන ප්‍රමාණයෙන් විශාලවී මෘදු බවට පත්වේ. මෙවැනි අමතර කොටස් රථ වාහන වලට සවි කිරීම ඉතාමත් අනතුරු දායක බැව් අපේ රියදුරන් නොදන්නවා විය හැක. ලංකාවේ ධාවනය වන විශාල වාහන ප්‍රමාණයක අමතර කොටස් නිතර නිතර මාරු කිරීමට සිදු වන්නේත්, බොහෝවිට තිරිංග ක්‍රියා විරහිත වන්නේත් මේ නිසාය.

වෙළඳපොලෙහි ඇති දේශීය රබර් භාණ්ඩවල තත්ත්වය මෙතරම් පහත් මට්ටමක තිබීමට ප්‍රධානම හේතුව එම භාණ්ඩ නිපදවීම සඳහා කර්මාන්තකරුවන් හට ඒ පිළිබඳ තාක්ෂණික දැනුමක් නොතිබීමය. මේ හේතුව නිසා සමහර අවස්ථාවලදී ඔවුන් අත්‍යාවශ්‍ය රසායනික ද්‍රව්‍ය භාවිතයට නොගනී. එසේ නැත්නම් ඒවා අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් හෝ අඩුවෙන් රබර් භාණ්ඩ නිෂ්පාදනයේදී යොදා ගනී. තවද බොහෝ සුළු කර්මාන්තකරුවන් විසින් රබර් වල්කනයිස් කිරීම සඳහා උපයෝගී කරගනු ලබන්නේ ඒ සඳහා කිසිසේත් නොගැලපෙන උපකරණය. බොහෝ අය

විසින් භාවිතා කරනු ලබන්නේ උෂ්නත්වය හෝ පීඩනය පාලනය කිරීමට නොහැකි අන්දමේ භූමිතෙල් උදුන් හෝ ගෑස් ලාම්පුය. උෂ්නත්වය පාලනය කිරීමට නොහැකිවීම නිසා ඔවුන් විසින් බොහෝ අවස්ථාවලදී වල්කනයිස්වීම ඉක්මවූ හෝ රබර් භාණ්ඩ නිෂ්පාදනය කර වෙළඳපලට ඉදිරිපත් කරයි.

එහෙයින් වෙළඳපලෙහි ඇති රබර් භාණ්ඩවල (විශේෂයෙන් සෞඛ්‍යයට අහිත කර) තත්ත්වයක් පාලනය කිරීම පිළිබඳ දැඩි අවධානයක් යොමුකිරීමට දැන් කාලය එළඹ ඇත. එමෙන්ම දේශීය රබර් කර්මාන්තකරුවන්ගේ දුර්වලකම් හා අවශ්‍යතාවයන් සොයාබලා ඒවාට නිසි උපදෙස් දීම ක්ෂණිකව ආරම්භ කළ යුතුව ඇත. නුදුරු අනාගතයේදීම මෙවැනි පියවරක් නොගතහොත් අපට සිදුවන්නේ මතුවටත අපේ වටිනා රබර් පිටරට යවා ඔවුන් විසින් නිෂ්පාදිත භාණ්ඩ නොවටිනා මුදලට නැවත ආනයනය කරවීමටය.

## රබර් නිෂ්පාදනයේදී අපද්‍රව්‍ය පෝර ලෙස භාවිතය.

රබර් නිෂ්පාදනයේදී අපතේ යන ද්‍රව්‍ය නැවත ප්‍රයෝජනයට ගත හැකිය යන්න වැදගත් පුවතකි. රබර් කේන්ද්‍රාපසරණයේදී එයට භාවිතා කරන භාජනයේ හා තර්කුවේ (පන්දුවේ) ඉතුරුවන ගොහොදු (මණ්ඩි) මෙතෙක් පරිසරය අපවිත්‍ර කරන ද්‍රව්‍යයන් ලෙස සලකන ලද නමුත් එය දැන් පෝර ලෙස ප්‍රයෝජනයට ගත හැකි බව සොයාගෙන ඇත. මෙය වැදගත් සොයාගැනීමකි. හේතුව වනුයේ 1970 සිටම නයිට්‍රජන්, පොස්පේට් සහ පොටෑසියම් පෝර ආනයනය කරන ලද ප්‍රමාණය සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතින අතර මිළද 50%ක් පමණ වැඩිවීමය. මෙම ගොහොදුවල නයිට්‍රජන් සහ පොටෑසියම් ප්‍රමාණය අඩු වුවත් පොස්පරස් සහ මැග්නීසියම් සෑහෙන ප්‍රමාණයක් ඇත. එම නිසා මෙම පෝර රබර් සහ රනිල වගාවන්ට පමණක් නොව ඉරිඟු, රටකජු, මුං ඇට ආදියටද සුදුසු බව පරීක්ෂණ වලින් පෙනී ගොස් ඇත.

මෙය සාදා ගත හැක්කේ මෙම ගොහොදු වසන ලද වියලි ස්ථානයක මාස කිහිපයක් පල්වීමට හැරීමෙන්ය. එහෙත් මෙම පෝරවල නයිට්‍රජන් සහ පොටෑසියම් ප්‍රමාණය අඩු හෙයින් මේ හා අතිරේක වශයෙන් නයිට්‍රජන් සහ පොටෑසියම් පෝරද ප්‍රයෝජනයට ගත යුතුය.

## කිරි කැපීමට නව ක්‍රමයක්

රොටර් ඉන්ජෙක්ටරය නැමැති බැටරි වලින් ක්‍රියා කරන සිරින්ජයක් වැනි උපකරණයක් යොදා ගැනීම රබර් කිරි කැපීමේ නවතම ක්‍රමයක් වනු ඇත. මෙම උපකරණ මලයාසියානු රබර් පර්යේෂණායතනය මගින් සැලසුම් කර අත්හදා බලා ඇති උපකරණ වලින් එකකි.

මෙම ක්‍රමය අනුව පොත්තේ සිරස් තීරුවක් සූරා දමා උත්තේජ කරනු ලැබේ. ඉන්පසු මෙම පොත්ත, විශේෂ වානේ ඉදිකටුවකින් කිහිප තැනක් සිදුරු කල පසු එම සිදුරුවලින් වෑස්සෙන කිරි ගලා ගොස් කිරි එකතුවන භාජනයට එක්වේ. සාමාන්‍ය කිරි කැපීමේදී මෙන් මෙහිදී පොත්ත ඉවත් කිරීමක් සිදු නොකෙරෙන අතර කිරිපිහිය වෙනුවට ඉදිකටු විශේෂයක් උපයෝගී කර ගැනේ. මෙම ක්‍රමය කුඩා වතු හිමියන්ට ඉතාමත් වාසිදයක වනු ඇත. මේ ක්‍රමය මගින් ඉක්මනටත් කිසි වෑයමක් නොමැතිවත් කිරි ලබාගත හැකිය. මෙය සැහැල්ලු මෙන්ම හොඳට සකස් වූවක් ය. බැටරි 4 ක් මගින් ක්‍රියා කෙරෙන මෙයින් දවසකට ගස් 800 කින් පමණ කිරි ලබාගත හැකිය.